**ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සහ සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකාබද්ධ නිවේදනය**

2017 මාර්තු 01

**ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවර්ධන කටයුතු සඳහා ඔස්ට්‍රේලියාව සහාය දක්වයි**

ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය සහ ආශ්‍රිත ක්ෂේත්‍රවල සර්වග්‍රාහී වර්ධනයක් ඇති කිරීමේ අරමුණ සහිතව නිර්මාණය කරන ලද "අලෙවිකරණ සංවර්ධන පහසුකම් වැඩසටහන", ඔස්ට්‍රේලියානු මහකොමසාරිස් බ්‍රයිස් හචිසන් සහ සංචාරක ප්‍රවර්ධන සහ ක්‍රිස්තියානු ආගමික කටයුතු ගරු අමාත්‍ය ජෝන් අමරතුංග යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2017 මාර්තු මස 1 වන දින දියත් කරන ලදී.

මෙම වැඩසටහන යටතේ ඔස්ට්‍රේලියානු රජය විසින් වසර 4ක කාලයක් සඳහා රුපියල් කෝටි 100ක මුදලක් ව්‍යාපාරික හා සංවර්ධන සේවාවන් සඳහා ප්‍රදානය කරනු ලැබේ.

පෞද්ගලික අංශය, සංවර්ධනයේත් රැකියා උත්පාදනයේත් ගාමක බලවේගය බවත්, ඔස්ට්‍රේලියාව තම තරගකාරී සංචාරක කර්මාන්තය පිළිබඳව බෙහෙවින් ආඩම්බර වන බවත්, බ්‍රයිස් හචිසන් මහතා පැවසීය. සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් අප සතු දැනුම හා අත්දැකීම් ශ්‍රී ලංකාවේ අපේ මිතුරන් සමග බෙදා ගැනීමේ අරමුණින් මෙම වැඩසටහන එළිදක්වන බවද බ්‍රයිස් හචිසන් මහතා පැවසීය.

අමාත්‍ය අමරතුංග මහතා සඳහන් කළේ "ලොව විශාලතම සේවා කර්මාන්තය සංචාරක ක්ෂේත්‍රය" බවයි. ඔස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර ඇති වූ මෙම සහයෝගීතා වැඩසටහන තුළින් විශාල වශයෙන් නව රැකියා අවස්ථා බිහිකර ගැනීමේ හැකියාව ලැබෙන අතර, කර්මාන්තයේ ප්‍රමිතීන් සහ සංචාරකයින්ට ලැබෙන අත්දැකීම්වල ගුණාත්මක බව තවදුරටත් ඉහළ නංවා ගත හැකි බවත් එම මහතා පැවසීය.

ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරයන් සමග කටයුතු කරමින්, සංචාරක ස්ථාන, සංචාරක නිෂ්පාදන සහ සේවාවන් විවිධාංගීකරණයකට ලක් කිරීම සඳහා මෙම වැඩසටහන යටතේ පහසුකම් සපයනු ලැබේ. කර්මාන්තයේ තරගකාරීත්වය සහ තිරසාරබව ගොඩනැගීම සඳහා මෙය වැදගත් පියවරක් වන අතර, වැඩි පිරිසකට ආර්ථික ප්‍රතිලාබ බෙදා හැරීමටද හැකියාව ලැබෙනු ඇත. "අලෙවිකරණ සංවර්ධන පහසුකම් වැඩසටහන" මගින් ඩිජිටල් සේවාවන් සහ දේශීය නිෂ්පාදන කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

මෙම වැඩසටහන පිළිබඳ විස්තර කළ හචිසන් මහතා පැවසුවේ "මෙම ක්‍රියාදාමය සමාජීය සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජනයක් වැනිය. සංචාරක හා ආශ්‍රිත ක්ෂේත්‍රවල

වාණිජමය තිරසාර බව සහ සමාජීය පිළිගැනීම වැඩි දියුණු කිරීමට මෙය උත්තේජකයක් වේයැයි අප බලාපොරොත්තු වෙනවා" යනුවෙනි.

ශ්‍රී ලංකාවේ "අලෙවිකරණ සංවර්ධන පහසුකම් වැඩසටහන" සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා marketdevelopmentfacility.org වෙත පිවිසෙන්න.